# දේශීය කෘෂි අංශයේ විකාශනය, පුරන් කුඹුරු අස්වැද්දීම සහ "අපි වවමු - රට නගමු" වැඩසටහන

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් ලෙස පැවත එන බව පැවසෙන ඓතිහාසික සාක්ෂි රැසකි. වරෙක ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය ලෙස විරුදාවලිය ලැබුවේ ද ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් පැවති නිසා ය.

- විදේශ යටත්වීම් වලට පෙර ශ්‍රී ලංකාව මුළුමනින් ම කෘෂි ආර්ථිකය මත රඳා පැවතින. ගෘහාශ්‍රිත සුළු කර්මාන්ත පැවතිය ද ඒවා කෘෂිකාර්මික අවශ්‍යතා ඉටු කිරීම සඳහා පමණක් විය.
- එවකට කෘෂිකර්මාන්තය යැපුම් මට්ටමේ අවශ්‍යතා සපුරා ගැනීමට දයක වූ අතර එය පවුල් හා අසල්වැසියන්ගේ ආහාර නිෂ්පාදනයට දයක විය. තමන්ගේ අතිරික්ත නිෂ්පාදනය හුවමරු කර ගැනීම තුළින් ද අවශ්‍යතා ඉටු කර ගැණුනි.
- අතීතයේ සම්පත් සීමා රහිත විය. ඉඩම් භුක්තිය පිළිබඳ ගැටලු නොවීය. මෙහි දී, ගොවීන් භුක්ති විදි ඉඩම් ප්‍රධාන වශයෙන් කොටස් 03 කට බෙද තිබුණි.

  (i) හේන (ii) ගෙවත්ත

  (iii) යාය හෙවත් කුඹුර

මෙහි දී, යාය හෙවත් කුඹුර මඩ ගොවිතැනට යොදා ගත් අතර කුඹුර අද්දර කොටස "**ඔවිට**" ලෙස හැදින්විනි. එහි එළවළු හා වෙනත් වගා සිදු කරන ලදී. මෙයට අමතරව ගොයම් කැපූ පසු ගොඩ ගැසීම, පෑගීම ද මේ ඕවිටිවල සිදු කෙරිණි.

මෙම කුඹුරු අසල ම ගෙවතු පිහිටි අතර එහි නිවාස සාද පදිංචි විය. ගෙවතුවල කුළු බඩු වගා කරන ලදී. හේන් යනු මේ සියලු දේවලට පරිබාහිරව පිහිටි කැලෑ ඉඩම් වන අතර වර්ෂා කාලයට ප්‍රථම කැළෑ කපා පුළුස්සා භෝග වගාව සිදු කරන ලදී. හේන්වල ගොඩ ගොවිතැන සිදු කළ අතර ම ධාන්‍ය වර්ග ද වගා කරනු ලැබීය.

මෙලෙස තමාගේ සියලු අවශ්‍යතා තමා විසින් නිපදවා ගත් අර්ථ ක්‍රමයක් එකල පැවතිනි. එය ස්වයංපෝෂිත ආර්ථිකයක් ලෙස හඳුන්වනු ලැබේ. මෙම කාලයේ දී විදේශ ගණු දෙනු නො පැවති අතර පැවතියේ රාජ්‍ය මට්ටමේ අවශ්‍යතා සඳහා වූ ගණු දෙනු පමණි.

දහසය වන ශත වර්ෂයේ ආරම්භයේ සිටම සිදු වූ යටත්විජිත ආධිපත්‍යයත් සමඟ ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ සහ කෘෂි කර්මාන්තයේ විශාල වෙනස්වීම් රැසක් සිදු විය. යටත්විජිත ආධිපත්‍යයේ වැදගත් සන්ධිස්ථානයන් නම්,

1505 දී පෘතුගීසීන් විසින් මුහුදුබඩ පළාත් අත්පත් කර ගැනීම.

1638 දී ලන්දේසි ආක්‍රමණය සිදුවීම.

1796 දී ඉංග්‍රීසීන් මුහුදුබඩ පළාත් අත්පත් කර ගැනීම.

1815 දී මුළු දිවයිනම ඉංග්‍රීසීන් යටත් කර ගැනීම යනාදිය යි.

පෘතුගීසීන් හා ලන්දේසීන් වෙළඳ කටයුතු වැඩි දියුණු කිරීමට උනන්දු විය. එම අවධීන්හි දී කුරුඳු, ගම්මිරිස් වැනි කුළුබඩු සඳහා හොඳ ඉල්ලුමක් පැවතිනි.

ඉංග්‍රීසීන් කුරුඳු, කෝපි භෝගවලට අමතරව තේ, පොල් හා රබර් යනුවෙන් වැවිලි ආර්ථිකයක් ස්ථාපිත කරන ලදී. වැවිලි ආර්ථිකය දියුණු වීමත් සමඟ තේ, රබර් හා පොල් ප්‍රධාන කෘෂි බෝග බවට පත් වූ අතර දේශීය කෘෂි කර්මාන්තය ක්‍රමයෙන් පිරිහීමට ලක් විය.

## දේශීය කෘෂි අංශය පිරිහීමට හේතු වූ ප්‍රධාන කරුණු

(i) සහල් ආනයනය කිරීම

දේශීය ගොවීන්ගේ ආහාර නිෂ්පාදනය වැඩි කිරීම කෙරෙහි පැවති උනන්දුව මේ නිසා අඩු විය.

(ii) රාජකාරි ක්‍රමය වෙනස් කිරීම

මෙරට පැවති රාජකාරි ක්‍රමය මඟින් කෘෂිකාර්මික ඇල-වේලි හා වාරිමාර්ග නඩත්තු වැනි පොදු කාර්යයන් අනාදිමත් කාලයක පටන් සිදු කෙරිණි.

(iii) ගම්සභා ක්‍රමය අවලංගු කිරීම

ගම්වල නායකයින් හා ප්‍රභූන්ගෙන් සමන්විත ගම්සභා අවලංගු කිරීම තුළින් ඒ අයගේ මූලිකත්වයෙන් සිදු වූ ගමේ වාරිමාර්ග නඩත්තුව, ඇල-වේලි නඩත්තුව අභාවයට පත් විය.

(iv) මුඩු ඉඩම් පනත ක්‍රියාත්මක කිරීම (1840 අංක 12 දරන)

මෙම පනත මඟින් ගොවීන්ට තමන්ගේ ඉඩම් අයිතිය ඔප්පු කිරීමට සිදු විය. පරිහරණය කරන ලද ඉඩම් අතුරින් හේන්වල අයිතිය ඔප්පු කිරීමට අපහසු විය. මේ ඉඩම් රජයට පවරා ගන්නා ලදී. හේන් තුළ වගා කටයුතු අහිමි විය.

(v) වාණිජ භෝගවල ලාභදයීත්වය වැඩිකම

වී වගාවෙන් ලබන ආදයමට වඩා වැඩි ආදයමක් වැවිලි භෝගවලින් ලබා ගත හැකි වීම නිසා ගොවිහු වී වගාව අත්හැර දැමීම. (වී ගොවිතැනින් ලැබෙන ආදයමට වඩා දුම්කොළ ආදයම ඉහළ වීම)

මෙවැනි තත්ත්වයක් තුළින් අධිරාජ්‍ය වාදීහු වැවිලි කර්මාන්තය දියුණු කිරීමට කටයුතු කළ හ. ඒ නිසාම, දේශීය කෘෂි කර්මාන්තය නො දියුණු තත්ත්වයට පත් විය. මෙහි අනිවාර්ය ප්‍රතිඵලය වූයේ දියුණු වැවිලි කෘෂිකර්මයක් හා නො දියුණු දේශීය කෘෂිකර්මය යන ද්විත්ව ලක්ෂණ එකම ආර්ථිකයක පැවතීමයි. මෙහි දී, වැවිලි කෘෂිකර්මාන්තය දියුණු විදේශීය තාක්ෂණ ක්‍රම මත සිදු වූ අතර දේශීය කෘෂි අංශය සාම්ප්‍රදායික ක්‍රම මත රඳා පැවතිණ. වතු අංශයට අවශ්‍ය යෙදවුම් බහුලව ලබා ගන්නා ලද්දේ විදේශ රටවලිනි. යන්ත්‍ර-සූත්‍ර භාවිතය සාපේක්ෂව ඉතා ඉහළ මට්ටමක විය. විදේශ වෙළඳපොළ තුළ ලාභ ලැබීම වැවිලි කෘෂි අංශයේ ප්‍රධාන අරමුණ විය.

සමාජීය වශයෙන් වැවිලි හා ග්‍රාමීය අංශ තුළ සබැඳියාවක් නොවීය. වැවිලි අංශයේ පාලනය කළ පිරිස, නාගරික පංතිය ලෙස සමාජ බෙදීමක් සිදු විය. ගම්වල බුද්ධාගම පැවති අතර නාගරික අංශයේ ක්‍රිස්තියානි හා හින්දු ලෙස ආගම් බෙදී පැවතිණ. ග්‍රාමීය සමාජය රෙද්ද, සරම භාවිතා කළ අතර දියුණු අංශය තුළ බටහිර සිරිත්-විරිත්, ගවුම-කලිසම භාවිතා විය.

මේ අනුව, වැවිලි ආර්ථිකයත් සමඟ ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ පැහැදිලි ලක්ෂණ 03ක් දක්නට විය.

1. යැපුම් කෘෂිකර්මාන්තයේ /දේශීය කෘෂි අංශයේ පිරිහීම.
2. ද්විත්ව ආර්ථික හා සමාජ රටාවක් බිහි වීම.
3. විදේශ වෙළඳමට යොමු වූ ආර්ථිකයක් ඇති වීම.

මෙහි දී, පාරිභෝගික ද්‍රව්‍ය රාශියක් ආනයනය කළ අතර සහල් ඉන් ප්‍රමුඛ විය. දේශීය නිෂ්පාදනයන් වන තේ, රබර්, පොල්, කොප්පරා හා පොල්තෙල් වැනි ද්‍රව්‍ය අපනයනය කරන ලදී. මෙලෙස විශාල ලෙස හැල-හැප්පීම්වලට භාජනය වූ ශ්‍රී ලංකා කෘෂි ආර්ථිකය ක්‍රමයෙන් යළි හිස ඔසවන තත්ත්වයට පත් විය. මෙයට ප්‍රධාන හේතු වූයේ, ග්‍රාමීය අංශය හා වැවිලි අංශය අතර සබඳතා දියුණු විමයි. එම සබඳතා වර්ධනය කෙරෙහි පහත සඳහන් කරුණු මුල් විය.

1. වැවිලි කර්මාන්තය හා සම්බන්ධ භෝග වගා බිම්, ගම් ආශ්‍රිතව ඇති වීම.
2. ග්‍රාමීය අංශය හා වතු අංශය අතර භාණ්ඩ හුවමාරු වීම. (කම්හල්වල නිෂ්පාදිත තේ කොළ හා ගොවි නිෂ්පාදන අතර හුවමාරුව)
3. වතු ආශ්‍රිතව සිල්ලර කඩ ඇතිවීම.
4. ගැමියන් වතුවල වැඩට යාම.

මේ ආකාරයට වැවිලි අංශය හා ග්‍රාමීය අංශය අතර එක්තරා අන්දමක සබඳතා ගොඩ

නැතිණි. මේ සමඟ ම යම් යම් අවස්ථාවල පැන නැඟුන ආර්ථිකමය හා දේශපාලනමය ක්‍රියාකාරකම් නිසා ද, දේශීය කෘෂි අංශය පිළිබඳ නොසලකා සිටීමට විදේශීය පාලකයන්ට නොහැකි විය. ලන්දේසි සමයේ දී, සහල් පිටරටින් ආනයනය කිරීම සඳහා අධික වියදමක් දැරීමට සිදු විය. මේ නිසා වී වගාවට වැඩි යොමු වීමක් ඇති විණි. **මුතුරාජවෙල** හා **මාතර** ප්‍රදේශවල කුඹුරු අස්වැද්දීම ආදී ප්‍රතිසංස්කරණ ලන්දේසි යුගයේ දී පවා සිදු ව තිබේ.

1848 ඇති වූ කැරැල්ලෙන් පසු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් කිහිප දෙනෙක් දේශීය කෘෂි අංශය දියුණු කිරීමට පියවර ගන්නා ලදී. 1856 දී කුඹුරු හා ඉඩම් වාරිමාර්ග ආඥා පනත ඇති කිරීමට සිදු වීම ද වැදගත් වේ. 1912 දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම පර්යේෂණ ආයතනය පිහිටුවීම දේශීය කෘෂි අංශයේ වර්ධනයට හේතු විය. මෙහි දක් වූ කරුණු නිසා විශේෂයෙන් ම අංක 1 වගුවෙන් පෙන්නුම් කරන පරිදි කුඹුරු වගා බිම් ප්‍රමාණය ක්‍රමයෙන් වර්ධනය විය.

**වගු අංක -1**

**වී වගා කළ භූමි ප්‍රමාණය**

| වර්ෂය | වගා බිම් ප්‍රමාණය (අක්කර) |
|---|---|
| 1871 | 544,000 |
| 1881 | 549,000 |
| 1891 | 563,000 |
| 1901 | 670,000 |
| 1911 | 645,000 |
| 1921 | 727,000 |
| 1931 | 811,000 |
| 1946 | 913,000 |

**මූලාශ්‍රය** - ***Snodgrass, D.R., Ceylon: An Export Economy in Transition - 1966***

පළමු ලෝක සංග්‍රාමය යටතේ ආර්ථිකය අපනයන භෝග මත රඳා පැවතීමේ අවදානම විදේශීය ආධිපත්‍යයට අවබෝධ විය. 1931 දී ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ යටත් විජිත සමයේ ශ්‍රී ලාංකිකයන්ට වැඩි බලතල ලැබුණි. කෘෂිකර්ම අමාත්‍යධුරය ශ්‍රී ලාංකිකයෙකුට පැවරීම (ඩී.එස්. සේනානායක මැතිතුමා) නිසාත්, දේශීය කෘෂි අංශයේ පිබිදීම යළි ඇති විය.

මෙහි දී,

- විදේශීය ආධිපත්‍ය නිසා ඉඩම් හිඟකම ගොවීන්ට තදබල ලෙස බලපා තිබුණි. ඊට විසඳුමක් ලෙස ඉඩම් කච්චේරි පවත්වා ගැමියන් අතර ඉඩම් බෙදා දෙන ලදී. මේ ක්‍රියාවලිය තුළ සිදු වූ වැදගත් කාර්යයන් කිහිපයක් නම්,
- 1931 සිට ගොවි ජනපද ආරම්භ කිරීම.
- 1935 දී ඉඩම් සංවර්ධන ආඥා පනත ඇති කිරීම.
- කෘෂි අලෙවිකරණ කටයුතු දියුණු කිරීම සඳහා අලෙවිකරණ දෙපාර්තමේන්තුව ආරම්භ කිරීම.

දෙවන ලෝක සංග්‍රාම සමයේ ඇති වූ ආහාර හිඟය තවදුරටත් දේශීය කෘෂිකර්මාන්තය වර්ධනය කරලීමට හේතු විය. මේ සඳහා රුකුල් දුන් කරුණු නම්,

- 1942 දී දේශීය වශයෙන් නිෂ්පාදනය කරන සහල් මිල දී ගැනීමට අභ්‍යන්තර මිල දී ගැනීමේ ක්‍රමයක් ආරම්භ කිරීම.
- 1948 දී වී භෝගයට සහතික මිල ක්‍රමයක් ඇති කර 1949 සිට එය ක්‍රියාත්මක කිරීම.

මේ අන්දමට ක්‍රමයෙන් දේශීය කෘෂි අංශය තුළ වී වගාව වර්ධනය වන්නට විය. 1948 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වී වගා නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 390,000 ක් විය.

## ශ්‍රී ලංකාවේ වී වගා බිම් ප්‍රමාණය

පහත වගු අංක 2 අනුව 1948 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් (දහස්) 346 කි. එම බිම් ප්‍රමාණය 1968 හෙක්ටයාර් (දහස්) 661ක්, 1980 දී හෙක්ටයාර් (දහස්) 815ක් හා 1984 වර්ෂයේ හෙක්ටයාර් (දහස්) 886ක් ලෙස ශීඝ්‍ර වර්ධනයක් සිදු වී තිබේ. 1948 සිට 1984 දක්වා වගා බිම් ප්‍රමාණය

156% දක්වා වූ ප්‍රතිශතයකින් වැඩි වී ඇත. මේ සමගම මෙම කාල පරාසය තුළ හෙක්ටයාරයකින් ලබන එලදාව 132.5% කින් වැඩි වීමක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය මෙන්ම ඒකක එලදාව ඉහළ දැමීම සඳහා වගා ක්‍රම

**වගු අංක - 2**

**ශ්‍රී ලංකාවේ වී වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදනය හා එලදාව (1948-1984)**

| වර්ෂය | වගා බිම් ප්‍රමාණය 000 හෙක්. | මුළු නිෂ්පාදනය 000 මෙ.ටො. | හෙක්ටයාරයකට එලදාව කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| 1948 | 346 | 390 | 1325 |
| 1952 | 446 | 604 | 1588 |
| 1958 | 502 | 765 | 1774 |
| 1968 | 661 | 1384 | 2397 |
| 1978 | 840 | 1894 | 2621 |
| 1980 | 815 | 2134 | 2631 |
| 1984 | 886 | 2413 | 3080 |

*මූලාශ්‍රය - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව. 2006*

දෙකක් අනුගමනය කර ඇත.

1. විස්තීරණ වී වගා ක්‍රමය
2. සූක්ෂම වී වගා ක්‍රමය

**විස්තීරණ වගා ක්‍රමය**

වී වගා කරන භූමි ප්‍රමාණය වැඩි කිරීම තුළින් නිෂ්පාදනය ඉහළ නැංවීම මෙහි අරමුණයි.

මේ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුමනය කොට ඇත.

- වියළි කලාපයේ ගොවි ජනපද ඇති කිරීම.
- පැරණි වාරිමාර්ග ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම.
- කෘෂි සංවර්ධන යෝජනා ක්‍රම ඇති කිරීම.
- වාරිමාර්ග පහසුකම් පුළුල් කිරීම.
- දියුණු බීජ වර්ග භාවිතය මගින් වගා කන්න ප්‍රමාණය වැඩි කිරීම.

ඉහත කරුණු නිසා වගා කරන භූමි ප්‍රමාණය ඉහළ නැංවීමට හැකි වී තිබේ.

**සූක්ෂම වගා ක්‍රමය**

අක්කර එකකින් ලැබෙන එලදායීතාවය වැඩි කිරීම තුළින් නිෂ්පාදනය ඉහළ නැංවීම මෙහි අරමුණයි. මේ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කොට ඇත.

- දියුණු බීජ වර්ග භාවිතය වැඩි කිරීම.
- පොහොර සහනාධාර ලබාදීම තුළින් නියමිත පොහොර ප්‍රමාණ යෙදීමට සැලැස්වීම.
- ග්‍රාමීය ණය පහසුකම් තුළින් යෙදවුම් භාවිතය ක්‍රමවත් කිරීම.
- අඳ-ගොවි අයිතීන් තහවුරු කිරීම නිසා ගොවි උනන්දුව වැඩි කිරීම.
- කෘෂි රක්ෂණය වැනි කටයුතු නිසා අස්වනුවල සුරක්ෂිතතාවය ඇති කිරීම.

ඉහත සඳහන් කළ වගා ක්‍රම දෙක යටතේ නිෂ්පාදන ධාරිතාව වර්ධනය වීමට 1960 දශකයේ සිදු වූ හරිත විප්ලවය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත. ඒ අතර,

- 1960 වර්ෂයේ පිලිපීනයේ මැනිලා හි අන්තර් ජාතික සහල් පර්යේෂණායතනය හා මැක්සිකෝවේ තිරිඟු හා ඉරිඟු පර්යේෂණ ආයතන විසින් ලෝකයේ ධාන්‍ය නිෂ්පාදනය වර්ධනය කිරීමේ ශිල්ප ක්‍රමය සොයා ගන්නා ලදී. මේ යටතේ වැඩි දියුණු කරනු ලැබූ උසස්

තත්ත්වයේ බීජ හා රසායනික පොහොර, පළිබෝධ නාශක, කෘමි නාශක, වල් නාශක, දිලීර නාශක හා යන්ත්‍ර සූත්‍ර ආදී ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට තුඩු දෙන්නා වූ යෙදවුම් යොදා ගැනීම හා නිෂ්පාදනය නිසා කෘෂි අංශය පිබිදීමකට ලක් විය. මේ කාර්යය හරිත විප්ලවය ලෙස හඳුන්වනු ලබන අතර මෙහි ප්‍රතිඵලය ශ්‍රී ලංකාවට ද බලපෑම් ඇති කළේය. මෙහි ප්‍රතිඵල ලෙස දියුණු බීජ වර්ග සාම්ප්‍රදායික වී වෙනුවට භාවිතය ප්‍රචලිත විය. මෙමගින් හෙක්ටයාරයකින් ලබන ඵලදාව ඉහළ නංවා ගැනීමට හැකි වී තිබේ.

- හරිත විප්ලවයේ නිසි ඵල ලබා ගැනීමට අවශ්‍ය වන පරිදි මෙරට කෘෂි ප්‍රතිපත්තීන් ද වෙනස් කරමින් යම් යම් සහනදායී වැඩසටහන් ක්‍රියාවට නැංවිණි. එනම්,
  - ග්‍රාමීය ණය යෝජනා ක්‍රම
  - ගොවි රක්ෂණ ක්‍රම
  - පොහොර සහනාධාර ක්‍රම
  - අද ගොවි අයිතිය ආරක්ෂා කිරීම
  - සහතික මිල ක්‍රමය පුළුල් කිරීම වැනි සහනාධාර ක්‍රම රාශියකි.
  - 1979 අංක 58 දරන අදටත් ක්‍රියාත්මක වන ගොවිජන සේවා පනත නීතිගත කරන ලදී.
  - 1980 දශකයේ ආරම්භ කළ මහවැලි යෝජනා ක්‍රමය තුළින් වගා කර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය වර්ධනය විය. මේ තුළින් නව වාරිමාර්ග පද්ධති හා ගොවි ජනපද ක්‍රියාවට නැංවිණි.


ඉහත තත්ත්වය යටතේ වී වගා බිම් ප්‍රමාණය හා හෙක්ටයාරයකින් ලැබිය හැකි අස්වැන්න විශාල ලෙස ඉහළ ගිය අතර ප්‍රස්ථාර අංක 1 යටතේ 1985-2007 කාල පරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති දත්ත විමසා බැලීමේ දී ඒ බව පැහැදිලි වේ.

තව දුරටත් ඉහත දත්ත පරීක්ෂා කිරීමේ දී සමස්ථයක් ලෙස ශ්‍රී ලංකාවේ වී වගා බිම් ප්‍රමාණයේ වර්ධනයක් දකිය හැකිය. 1985 සිට 2006 දක්වා දත්ත පරීක්ෂා කිරීමේ දී, වගා බිම් ප්‍රමාණයේ 3.3% ක වර්ධනයක් සහ අක්කරයක ඵලදාවේ 28.4% ක වර්ධනයක් දක්නට ලැබේ. ඒ තුළින් නිෂ්පාදනයේ 25.5%ක වර්ධනයක් සිදු වී ඇත.


දනට ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා යෙදවිය හැකි මුළු ඉඩම් ප්‍රමාණයම මේ කාර්යය සඳහා යෙදවනු ලැබ ඇත. සීමිත සම්පත් ප්‍රමාණයක් වේගයෙන් ඉහළ යන ජනගහනය හමුවේ ප්‍රබල ගැටලුවක්ව පවතී. එද සිට විවිධ ශිල්පීය ක්‍රම හා සහනාධාර ලබාදීම මෙන්ම විවිධ රජයන්වල පැවති උත්සාහය කැප කිරීම මත වී වගා බිම් ප්‍රමාණය වර්ධනය වී තිබේ.

ප්‍රස්ථාර අංක 1 මගින් ශ්‍රී ලංකාවේ වගා බිම් ප්‍රමාණය අඩු වැඩි වීම් සහිතව

**ප්‍රස්ථාර අංක - 1**



## ප්‍රස්ථාර අංක - 2




වර්ධනයක් උපනති රේඛාව මඟින් පෙන්නුම් කරයි. කලාප වශයෙන් සැලකීමේ දී තෙත් කලාපයේ (ප්‍රස්ථාර අංක 1) මෙම වගා බිම් ප්‍රමාණයේ අඩුවීමක් දක්නට ලැබෙන බව ද සඳහන් කළ යුතුය.

තෙත් කලාපය පළාත් 04 කින් යුතු වන අතර එම පළාත් අනුව වී වගා බිම් ප්‍රමාණයේ ශීඝ්‍ර අඩුවීමක් ප්‍රස්ථාර අංක 2 මඟින් පැහැදිලි කරයි.

මෙලෙස තෙත් කලාපයේ කුඹුරු අක්කර ප්‍රමාණය අඩුවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ කුඹුරු පුරන්වීමයි. මෙම කුඹුරු පුරන්වීමට හේතු වූ සාධක රාශියක් හඳුනා ගෙන තිබේ.

- නියම අයුරින් වාරි පද්ධති නොමැති වීම
- ජලය හිඟකම/වර්ෂා කාලයට ජලය බැස නො යාම
- ලවනතාවය වැඩිවීම/යකඩ විෂවීම
- කුඹුරු ඉඩම් ගොඩ කිරීම
- ඉඩම් කුඩා කට්ටිවලට කැඩී යාම
- තට්ටු මාරු/කට්ටි මාරු ක්‍රම නිසා පවතින ගැටලු
- තෙත් කලාපයේ වී වගාව ආර්ථික වශයෙන් එතරම් ඵලදායී නොවීම

අතීතයේ අපේ මුතුන් මිත්තන් හා පැවති රජයන් නව කුඹුරු අස්වැද්දීමට විවිධ ක්‍රම උපයෝගී කර ගනු ලැබීය.

වර්තමාන රජය විසින් එකී අස්වද්දන ලද කුඹුරු විවිධ කරුණු මත පුරන්වීම හේතුවෙන් නැවත අස්වැද්දීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

මෙය ජාතික අවශ්‍යතාවයකි. මේ සඳහා **"මහින්ද චින්තන"** රජයේ ජාතික ප්‍රතිපත්තිය තුළින් මෙන් ම **"අපි වවමු-රට නගමු"** නම් දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම තුළින් ද ක්‍රියාමාර්ග ගෙන තිබේ.

පුරන් කුඹුරු යළි වගා කිරීමට ඉහත දක් වූ ජාතික වැඩපිළිවෙළ ක්‍රියාත්මක වනු ඇති අතර එය සාර්ථක අයුරින් ක්‍රියාත්මක වීමට රජය විසින් විශේෂ සහනාධාර සහ විශේෂ ක්‍රමෝපායයන් දියත් කර ඇත. ඒවා නම්,

- පොහොර සහනාධාර ක්‍රමය වඩාත් ලාභදායී අයුරින් ක්‍රියාත්මක කිරීම (රු. 350/- බැගින් පොහොර ලබා දීම.)
- මෙම පුරන් කුඹුරු සඳහා පරිසරයට උචිත වී ප්‍රභේද ලබාදීම
- තෙත් කලාපයේ වී වගාවට පාරම්පරික වී සහ මා වී ප්‍රභේද ලබාදීම
- වගා කිරීමට උත්සාහ නො ගන්නා කුඹුරු ඉඩම්වල වගා කිරීමේ අයිතිය විධිමත් ගොවි සමිති හෝ සංවිධානවලට පැවරීම
- කුඹුරුවල යෝග්‍යතාවය අනුව වෙනත් භෝගයන් වගා කිරීමට ගොවි පනත අනුව ක්‍රියාත්මක කිරීම
- සහල් නිෂ්පාදනවලින් නව නිෂ්පාදන ඇති කිරීමට කටයුතු කිරීම

- ධාන්‍යාගාර වැඩසටහන යටතේ හෙක්ටයාරයකින් ලබන අස්වැන්න උපරිම කිරීම
- "සරුකෙත" වැඩසටහන යටතේ වගා බිම් ප්‍රමාණය තවදුරටත් වැඩි කිරීම
- සහල්වල ගුණාත්මක තත්ත්වය දියුණු කිරීමට සහල් සැකසුම් ගම්මාන වැඩපිළිවෙල දිරිමත් කිරීම
- ගොවිජන සේවා දෙපාර්තමේන්තුව එහි ප්‍රාදේශීය නිලධාරීන් හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් මඟින් මෙම පුරන් කුඹුරු අස්වැද්දීමට මූලිකත්වය ගෙන කටයුතු කිරීමට යොමු කරවීම
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විවිධ ආකාරයේ තාක්‍ෂණ කටයුතු මෙහෙයවීම් තුළින් ඒකකයකින් ලබා ගත හැකි අස්වැන්න ප්‍රමාණය වර්ධනය කරලීමට කටයුතු කිරීම
- විවිධ රාජ්‍ය ආයතන මෙන් ම රාජ්‍ය නොවන ආයතන මාර්ගයෙන් පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා සහාය ලබා ගැනීම. උද :- දක්ෂිණ ලංකා අධිකාරිය
- විවිධ දේශපාලන නායකත්වය මේ කටයුතු සාර්ථක කරලීමට මැදිහත් වීම උදා:- විමධ්‍යගත අරමුදල් මේ සඳහා වෙන් කිරීම මෙන්ම වප් මඟුල් වැනි උත්සව සංවිධානය තුළින් ප්‍රචාරයක් ලබාදීම.

ආර්යයන්ගේ පැමිණීමත් සමඟ දියුණු වෙමින් පැවති කෘෂිකර්මාන්තය විදේශීය ආධිපත්‍ය නිසා පිරිහීමකට ලක් විය. නැවත නිදහසින් පසු යළි හිස ඔසවා වර්තමානය වන විට සහලින් ස්වයංපෝෂිත වීමට ආසන්නව ඇත. ඒ ආසන්නවීම යථාර්තයක් බවට පත් කිරීමට සියලු පුරන් වී ඇති කුඹුරු යළි අස්වැද්දීම සිදු කළ යුතුය.

ඉතා වේගයෙන් කාර්මීකරණයට ලක් වූ ඉන්දුනීසියාව, චීනය, ජපානය වැනි රටවල් කුඹුරු ඉඩම්, නිවාස හා කර්මාන්ත වෙනුවෙන් ගොඩ කිරීම තහනම් කරමින් නියෝග පනවා තිබේ. මෙම බොහොමයක් කුඹුරු ගොඩ කෙරෙන්නේ නිවාස හා ගොඩනැඟිලි ඉදි කිරීම් සඳහා ය. කුඹුරු ඉඩම්, කුඹුරු ලෙස තිබීම නිසා පරිසර හානිය ද අවම වන අතර ඉදිරියේ දී ජනගහන වර්ධනයත් සමඟ කුඹුරු ලෙස භාවිතා කිරීමට ද හැකියාව ලැබේ. මෙරට තුළ ද එවැනි නීති තදින් ක්‍රියාත්මක කළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ පැරණි මුතුන් මිත්තන් ගොවිතැන සිය ජීවිතය කොට සලකන ලදී. ඒ අයගේ ජීවන පුරුදු, සිරිත් විරිත්, භාෂාව, කලාව ආදී සමාජීය ජීවිතයේ සෑම අංගයකම වී ගොවිතැන කේන්ද්‍ර කොට ගැණුනි. හී කවි, ගොයම් කවි, පැල් කවි මේ සියල්ල වී ගොවිතැන හා බැඳී පැවතිණ. හිමිදිරි පාන්දරම කුඹුරට යාමේ ජීවන පුරුද්දක් පැරණි සමාජය තුළ විය. නව ආර්ථික රටා හමුවේ මේ සියලු සම්බන්ධකම් වලින් මිනිසා ඈත් වී සිටියි. තරඟකාරී ජීවන රටාව හමු වේ රුපියල් ශත හඹා යන සමාජයක ගොවිතැන ජීවිතය ලෙස සලකා පවතින තරඟයට මුහුණ දිය හැකි ද? යන්න ගැටළුවකි. වර්තමානයේ ගොයම් කවි, කමත් කවි හා පැල් කවි වේදිකාවලට සීමා වී තිබේ. සියලු කෘෂිකාර්මික චාරිත්‍ර වාරිත්‍ර මාධ්‍යවලට සීමා වී ඇත. මෙවැනි නූතන සමාජයක "අපි වවමු-රට නඟමු" තුළින් කෘෂි ක්ෂේත්‍රයට නව ප්‍රාණයක් ලබාදීම ඉතා වැදගත් වූවකි.

මෙරට ප්‍රධාන ආහාරය බත් ය. එමෙන්ම, බත් ප්‍රධාන ආහාරය ලෙස ගන්නා රටවල් බොහෝ ය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දත්ත අනුව ක්‍රි.ව. 2025 වන විට ලෝක ජනගහනය බිලියන 08 ක් වන අතර

***32 වෙනි පිටුවට .....***

**එස්. ඇපාසිංහ**
**පර්යේෂණ නිලධාරී**
**හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

32 වෙනි පිටුවෙන් .....

## දේශීය කෘෂි අංශයේ ......

එයින් බිලියන 05 ක පමණ ප්‍රධාන ආහාරය වන්නේ බත් ය. මෙම ප්‍රමාණය සපුරාලීමට දැනට මෙ.ටො. මිලියන 540 ක් වන ලෝක සහල් නිෂ්පාදනය මෙ.ටො. මිලියන 840 දක්වා වර්ධනය කර ගත යුතුව පවතී. කෘෂිකාර්මික ඉඩම් කාර්මීකරණයට යොමු වන යුගයක වාරිමාර්ග සඳහා අඩු පහසුකම් ඇති අවධියක "අපි වවමු-රට නහමු" තුළින් පුරන් කුඹුරු වගාවට ගොවීන් යොමු කිරීම ඉතාම කාලෝචිත ය.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සලකා බලන විට, කෘෂිකර්මාන්තය යනු වී වගාව මුල් කර ගත් අංශයකි. තනි භෝගයක් ලෙස එමගින් දළ ජාතික නිෂ්පාදිතයට 2007 වසරේ ලබා දුන් දයකත්වය 1.57% ක් බව ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා දත්ත සඳහන් කරයි. මේ නිසා පුරන් වී යන කුඹුරු යළි වගා කිරීමට ක්‍රමෝපායයන් දියත් කිරීම කාලීන වැදගත්කමක් උසුලන බවයි. "**අපි වවමු-රට නහමු**" දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ වැඩසටහන තුළින් පුරන් කුඹුරු නැවත අස්වැද්දීමේ කාර්යය සඳහා පූර්ණ දයකත්වය ලබාදීම මුතුන් මිත්තන් දයාද කළ ඒ සශ්‍රීකත්වය නැවත පණ ගැන්වීමක් වේ. ඒ සඳහා ජාතියක් ලෙස අපි එක්ව කටයුතු කිරීමට කැපවෙමු. "**අපි වවමු-රට නහමු**" ජාතික වැඩපිළිවෙල සාර්ථක කර ගනිමු.